ලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2023 (2024)

# 29 - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන / සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

# 29 - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

**I පත්‍රය** = කාලය පැය 02 යි

වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50 කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.
එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 50 කි.

**II පත්‍රය** = කාලය පැය 03 යි

ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 07 කින්, 05 කට පිළිතුරු සැපයිය යුතුය.
එක් ප්‍රශ්නයකට ලකුණු 40 බැගින් මුළු ලකුණු 200 කි.

**අවසාන ලකුණු ගණනය කිරීම :**

| | | |
|---|---|---|
| **I පත්‍රය** | = | 50 |
| **II පත්‍රය** 200 ÷ 4 | = | 50 |
| **අවසාන ලකුණු** | = | 100 |

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය / க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2023 (2024)

**විෂය අංකය / பாட இலக்கம்:** 29

**විෂයය / பாடம்:** සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## ලකුණු දීමේ පටිපාටිය / புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය / பத்திரம் I

| ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරු අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරු අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරු අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරු අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරු අංකය / விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 5 | 21. | 4 | 31. | 2 | 41. | 4 |
| 02. | 1 | 12. | 3 | 22. | 3 | 32. | 5 | 42. | 3 |
| 03. | 3 | 13. | 5 | 23. | 2 | 33. | 1 | 43. | 1 |
| 04. | 2 | 14. | 1 | 24. | 5 | 34. | 4 | 44. | 4 |
| 05. | 3 | 15. | 2 | 25. | 5 | 35. | 4 | 45. | 2 |
| 06. | 1 | 16. | 4 | 26. | 5 | 36. | 5 | 46. | 4 |
| 07. | 4 | 17. | 3 | 27. | 1 | 37. | 5 | 47. | 3 |
| 08. | 2 | 18. | 4 | 28. | 5 | 38. | 3 | 48. | 3 |
| 09. | 1 | 19. | 4 | 29. | 2 | 39. | 2 | 49. | 4 |
| 10. | 3 | 20. | 3 | 30. | 1 | 40. | 5 | 50. | 2 |

**විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் :**

එක් පිළිතුරකට / ஒரு சரியான விடைக்கு ලකුණු 01 බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் 01 × 50 = 50



CamScanner

**1. සන්නිවේදනය විවිධාකාර වේ.**
**(i) නව මාධ්‍යවල දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් නම් කරන්න.**

(i)

- අංකිතකරණය
- ජාලගතකරණය
- අන්තර්ක්‍රියාකාරීත්වය
- ආධිපාධනීයත්වය
- ස්වයංකරණය
- දත්ත සංචිතකරණය
- වේගවත් සන්දේශකරණය

ලකුණු $2 \times 2 = 4$

**(ii) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයේ ප්‍රයෝජන දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.**

- පෞරුෂ වර්ධනය
- ස්ව සංකල්පය පෝෂණය
- චින්තනය ගොඩනංවා ගැනීමට
- මතක තබා ගැනීම සඳහා
- තීරණ ගැනීමට
- විචාරශීලීත්වය වර්ධනය කර ගැනීමට
- නිර්මාණශීලීත්වය ඔප් නංවා ගැනීමට

ලකුණු $4 \times 2 = 8$



CamScanner

(iii) විල්බර් ශ්‍රාම් විසින් දක්වන ලද ජනමාධ්‍ය මගින් ඉටු කළ යුතු ප්‍රධාන භූමිකා තුන පිළිබඳ විග්‍රහයක් කරන්න.
(

- **ආරක්ෂකයෙකුගේ භූමිකාව**

  අභ්‍යන්තර හා බාහිර වශයෙන් එල්ලවිය හැකි තර්ජන පිළිබඳව අවධියෙන් හා අවධානයෙන් සිට කටයුතු කිරීම

- **සාකච්ඡා මණ්ඩපයක භූමිකාව**

  විවිධ පාර්ශව එකට මුණගස්වමින් මතවාදී සංවාදයක් සඳහා යොමු කිරීම.

- **ගුරුවරයෙකුගේ භූමිකාව**

  දැනුම, ආකල්ප, කුසලතා හා නිපුණතාවලින් ජනතාව සන්නද්ධ කිරීම

ලකුණු $4 \times 3 = 12$

(iv) නිර්මාණකරුවෙකුට අන්තර් සංස්කෘතික අධ්‍යයනය වැදගත්වන ආකාරය කරුණු හතරක් ඇසුරින් පැහැදිලි කරන්න.
(

- ජන විඥානය අවබෝධ කර ගැනීමට
- නිර්මාණාත්මක චින්තනය පෝෂණය කර ගැනීමට
- විවිධ සංස්කෘතීන් පිළිබඳව දැනුම, අවබෝධය ගොඩනැගීමට
- සංස්කෘතියක පවත්නා වටිනාකම් හා හර පද්ධතිය හඳුනා ගැනීමට
- සංස්කෘතියට ආවේනික චර්යා රටා පෙන්නුම් කිරීමට
- සංස්කෘතික තුලනය සඳහා අවස්ථාව සැලසීමට
- සංස්කෘතික විවිධත්වයට ගරු කරමින් නිර්මාණ බිහිකිරීමට
- අන්තර් සංස්කෘතික සංහයෝගීතාව ඇති කරවීමට
- නව තේමාවන් සොයාගැනීමට උපකාරී වීමට
- නිර්මාණ සඳහා විවිධ සංස්කෘතීන් යොදා ගැනීමට
- නව චින්තනයන් සකස් කර ගැනීමට
- නව නිර්මාණ සඳහා උත්තේජනයක් ලබා ගැනීමට.

ලකුණු $4 \times 4 = 16$

**2. ජනමාධ්‍ය ක්‍රියාවලියේ දී ග්‍රාහක අවධානය ලබා ගැනීම වැදගත් වේ.**

**(i) ජන සන්නිවේදනයේ මූලික ලක්ෂණ හතරක් නම කරන්න.**

- තාක්ෂණික මෙවලම් භාවිතය
- අඛණ්ඩත්වයකින් යුක්ත වීම
- සංවිධානගත ආයතනික ව්‍යුහයකින් සමන්විත වීම.
- වෘත්තිමය සන්නිවේදකයෝ කටයුතු කිරීම
- බහුවිධ දොරටුපාලක ක්‍රියාවලියට යටත් වීම
- ප්‍රමාදිත ප්‍රතිපෝෂණයක් දක්නට ලැබීම
- බොහෝ විට වාණිජත්වය පදනම් කර ගැනීම
- පොදු සංදේශ සම්ප්‍රේෂණය කිරීම
- සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර දුරස්ථ සම්බන්ධතාවයක් පැවතීම
- සාපේක්ෂව අධික පිරිවැයක් දැරිය යුතු වීම.
- භූගෝලීය සීමා රහිත, විසිරුණු ග්‍රාහක ක්ෂේත්‍රයක් සිටීම
- බොහෝවිට ඒක මාර්ගික වීම

**ලකුණු 1 x 4 = 4**

**(ii) විචාරශීලී ග්‍රාහකයෙකු සතු කුසලතා දෙකක් කෙටියෙන් පහදන්න.**

- ***විශ්ලේෂණය*** -
  මාධ්‍ය සංදේශයක අන්තර්ගතව ඇති හෝ සංයෝග වී ඇති තොරතුරු වෙන් කර හඳුනා ගැනිම
- ***ඇගයීම*** -
  මාධ්‍ය සංදේශයන්හි ගුණ හා අගුණ සොයා බලමින් තක්සේරු කිරීම
- ***කාණ්ඩකරණය*** -
  මාධය සන්දේශ කාණ්ඩවලට බෙදා වෙන් කර ගැනීම
- ***අනුමානය*** -
  මාධ්‍ය සංදේශයේ ඇතුළත් වන දේ අනුව සිතා බලා සමස්ත රටාව අනුමාන කිරීම.
- ***නිගමනය*** -
  මාධ්‍ය සංදේශයන්හි පොදු තත්ත්වයන් ඇසුරින් විශේෂිත යමක් නිගමනය කිරීම
- ***සංස්ලේෂණය*** -
  අන්තර්ගත විවිධ කොටස් එකතු කර නව ව්‍යුහයක් ගොඩනැගීම.
- ***වියුක්තිකරණය (සංක්ෂේපකරණය)***
  මාධ්‍ය සංදේශයන්හි හරය හා වැදගත් කරුණු ඉතා කෙටියෙන් පැහැදිලි ලෙස දැක්වීම

**ලකුණු 4 x 2 = 8**

CamScanner

(iii) ව්‍යාපාර මහජන සම්බන්ධතාවේ දී ග්‍රාහකයා ආකර්ෂණය කරගැනීම සඳහා යොදා ගත හැකි උපක්‍රම තුනක් විස්තර කරන්න.

- වෙළඳ වට්ටම් ලබා දීම
- විශේෂ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම
- ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති (CSR) ක්‍රියාවට නැංවීම
- වෙළඳ ප්‍රචාරණ සිදු කිරීම
- වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම
- අනුග්‍රහකත්වය ලබා දීම
- දෙස් විදෙස් සංචාර සඳහා අවස්ථාව ලබා දීම.
- පුවත් හසුන
- ඡායාරූප භාවිතය / වීඩියෝ භාවිතය
- ත්‍යාග ලබා දීම.

ලකුණු 4 x 3= 12

(iv) රටක මාධ්‍ය ප්‍රතිපත්තියේ ඇති වැදගත්කම ප්‍රධාන කරුණු හතරක් ඔස්සේ පැහැදිලි කරන්න.

- නිරවද්‍යතාව, අපක්ෂපාතීත්වය හා සාධාරණත්වය පිළබඳ මූලධර්මවලට ගරු කිරීම
- ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව අවබෝධය ඇති කිරීම
- ප්‍රජා අතර සම්බන්ධතාව ප්‍රවර්ධනය කිරීම
- ප්‍රකාශන නිදහස සහතික කිරීම
- විවිධ සංස්කෘති හා ප්‍රජා අතර සමගිය ප්‍රවර්ධනය කිරීම
- සියලුම මාධ්‍ය ආයතනවල කාර්යභාරය ස්වාධීන කිරීම
- සංස්කෘතික නිදහස ප්‍රවර්ධනය
- ආචාර ධර්ම හා සදාචාරාත්මක මාධ්‍ය පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම
- ස්වාධීන යාන්ත්‍රණය මගින් මාධ්‍ය ක්ෂේත්‍රයේ විනිවිදභාවය ගොඩනැගීම
- මාධ්‍ය නියාමනය
- මාධ්‍ය ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා පුහුණු අවකාශ සැලසීම
- තාක්ෂණික හා යටිතල පහසුකම් සංවර්ධනය වැදගත් වේ.

ලකුණු 4 x 4 = 16

3. සමකාලීන මාධ්‍ය ප්‍රවණතා හේතුවෙන් ග්‍රාහකයින්ගේ සන්නිවේදන කුසලතා වර්ධනය වී ඇත.
(i) වාචික සන්නිවේදන කුසලතා වර්ධනයට ඉවහල් වන කරුණු **හතරක්** නම් කරන්න.

- වාග් කෝෂය පුළුල් කර ගැනීම
- තමා සතු අදහස් හා තොරතුරු ඇතුළත් දැනුම වර්ධනය කර ගැනීම
- පෙර සූදානම
- ග්‍රාහක ක්ෂේත්‍රයට ගැලපෙන ආකාරයට වාචික සන්නිවේදනය ගලපා ගත යුතු ය.
- ඉදිරිපත් කිරීමේ කුසලතා වැඩි දියුණු කර ගැනීම
- යෝග්‍ය භාෂා ශෛලීන් භාවිතය
- පෞද්ගලික අනන්‍යතාවයක් සහ ස්වාධීනත්වයක් ගොඩනැගීම
- වගකීමෙන් යුතුව වචන භාවිත ය.
- ව්‍යාකරණ, විරාම ලක්ෂණ වැනි භාෂාත්මක විධික්‍රම අනුගමනය කිරීම
- කථනය සහ ලේඛනයේ දී අනුගමනය කළ යුතු භාෂාත්මක ක්‍රමවේදයන් කෙරේ අවධානය යොමු කිරීම
- යෝග්‍ය අවස්ථාවන්හි දී සුදුසු නිර්වාචික විධික්‍රම භාවිත කිරීම.

*ලකුණු 1 x 4 = 04*

(ii) අන්තර්ජාල සන්නිවේදනය අධ්‍යාපන කාර්ය සඳහා යොදා ගත හැකි ආකාර **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

- මාර්ගගත දේශන /ක්‍රියාකාරකම් පැවැත්වීම හා සහභාගී වීම
- අධ්‍යාපන ක්‍රියාකාරකම් සබැඳිය හා සම්බන්ධ වූවන් සමග බෙදා හදා ගත හැකි වීම.
- වීඩියෝ, ඡායාරූප, ශබ්ද ආදී ආකාර වලින් අධ්‍යාපනික තොරතුරු හුවමාරු කර ගත හැකි වීම. , Pdf
- ස්වයං අධ්‍යයනය සඳහා ප්‍රවේශවීමට ඇති හැකියාව
- ඇගයීම හා තක්සේරු කිරීම සඳහා යොදා ගත හැකි වීම.
- විවිධ සෙවුම් යන්ත්‍ර හා මෘදුකාංග භාවිත (Yahoo, Google) කළ හැකි වීම
- විභාග (ඇගයුම් /තක්සේරුකරණ) ක්‍රියාකාරකම් අන්තර්ජාල සන්නිවේදනය ඇසුරින් සිදු කළ හැකි වීම.
- විභාග සඳහා පෙනී සිටීම

*ලකුණු 4 x 2 = 08*



CamScanner

**(iii) සාම්ප්‍රදායික මාධ්‍යයන්හි විශේෂතා තුනක් උදාහරණ සහිතව විස්තර කරන්න.**

- සරල ව්‍යුහය
- තේමාත්මක අන්තර්ගතය
- නම්‍යශීලීත්වය
- සංස්කෘතික සන්දර්භය
- අවම පිරිවැය
- ජන මූල පදනම
- විශ්වාසය හා ගරු කිරීම
- පොදු පිළිගැනීම හා පොදු යහපත
- පාරම්පරිකව උරුම වීම

*විස්තර කිරීමට 3 x 3 =9*

*උදාහරණ දැක්වීමට 1 x 3 = 3*

*12*

**(iv) ශ්‍රී ලංකාවේ මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ ආයතනික ප්‍රවණතා හතරක් නම් කර ඉන් දෙකක් උදාහරණ ඇසුරින් විස්තර කරන්න.**

- *හිමිකාරීත්වය* -
  පෞද්ගලික මාධ්‍ය ප්‍රමාණාත්මකව වැඩිවීම හා එක් හිමිකාරීත්වයක් යටතේ මාධ්‍ය ආයතන ගණනාවක් පැවතීම
- *ප්‍රාදේශීය මාධ්‍ය* -
  අගනුවරින් බැහැරව වෙනත් ප්‍රදේශවල මාධ්‍ය ආයතන ක්‍රියාත්මක වීම
- *මාධ්‍යකරුවෝ* -
  මාණ්ඩලික මාධ්‍යකරුවන්ට වඩා නිදහස් හා විශේෂාංග වාර්තාකරුවන් බිහිවීම. නව පන්නයේ මාධ්‍ය ව්‍යවසායකත්වයක් බිහි වීම. නිවසේ සිට මාධ්‍යකාර්යයේ නිරත වීම
- *ස්ත්‍රී පුරුෂ සමාජ තත්ත්වය* -
  ජනමාධ්‍ය ආයතනවල විවිධ ක්ෂේත්‍රයන්හි ස්ත්‍රී නියෝජනය සැලකිය යුතු මට්ටමින් ඉහළ යාම
- *මාධ්‍ය නියාමනය* -
  රාජ්‍ය නියාමනයට අමතරව ස්වයං ආයතනිකනියාමන ක්‍රම සඳහා යොමු වීම
- *සංස්කාරක නිදහස* - (සංස්ලේෂීය නිදහස)
  රාජ්‍ය හා පෞද්ගලික ජන මාධ්‍ය තුළ දෙයාකාරයකින් සංස්කාරක නිදහස ක්‍රියාත්මක වීම. (වෘත්තීය සමිති ක්‍රියාකාරීත්වයට රාජ්‍ය මාධ්‍ය පමණක් පහසුකම් සැලසීම)

*නම් කිරීම 1 x 4 =4*

*විස්තරකිරීම 4 x 2 = 8*

*උදාහරණ දැක්වීම 2 x 2 = 4*

*16*

**4. (i) ශරීර භාෂාවේ දක්නට ලැබෙන නිර්වාචික සන්නිවේදන ක්‍රම දෙකක් නම් කරන්න.**

- මුහුණේ ඉරියව්
- අංග චලනය
- ඇස් සම්බන්ධතාව
- අභිනය
- පුද්ගල විලාස (ඉරියව්)
- හිස සැලීම
- හස්ත සංඥා
- සිනහව
- දෙවුර සෙලවීම
- ස්පර්ශය
- [illegible]

*ලකුණු 2 x 2 = 04*

**(ii) පාසල් මාධ්‍ය සමාජය තුළ සමූහ සන්නිවේදනය භාවිත කිරීමේ ප්‍රයෝජන දෙකක් කෙටියෙන් විස්තර කරන්න.**

- සාමූහිකව සාකච්ඡා කළ හැකි වීම
- පොදු සම්මුතියකට එළඹිය හැකි විම
- සාමූහික කුසලතා භාවිත කිරීමට හැකි වීම
- දැනුම, අත්දැකීම්, සම්පත් හුවමාරු කරගත හැකි වීම
- නව අදහස් හා මතවාද දැන ගැනීමට හැකිවීම
- පොදු අධ්‍යාපනික, රසවින්දනය යනාදී කටයුතු වලට යොදා ගත හැකි වීම.
- වගකීම හා වගවීම පිළිබඳ අවබෝධයෙන් කටයුතු කිරීම
- කාර්යක්ෂම භාවය

*ලකුණු 4 x 2 =8*

**(iii) ඇරිස්ටෝටල් සන්නිවේදන ආකෘතියේ මූලිකාංග තුනක් උදාහරණ සහිතව පහදන්න.**

- ***කථිකයා*** -
  සංදේශය ඉදිරිපත් කරන්නා මෙමගින් අර්ථ දැක්වේ.
- ***කථාව*** -
  කථිකයා ඉදිරිපත් කරන තොරතුරයි.
- ***ශ්‍රාවකයා*** -
  කථාව හෝ දේශනය අසා සිටින්නන් පිළිබඳව මින් කියැවේ.
- ***අවස්ථාව*** -
  සන්නිවේදනය සිදු කරනු ලබන වට පිටාව
- ***බලපෑම*** -
  අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම හේතු කොට ගෙ ඇති වෙනස

*විස්තරයට ලකුණු 3 x 3 =9*

*උදාහරණයට 1 x 3 = 3*

*12*

CamScanner

(iv) ගැමි නාටක විවිධ සන්නිවේදන අවස්ථා ජනනය කරයි. මෙම ප්‍රකාශය ඔබගේ සන්දර්භයට අදාළ ගැමි නාටක දෙකක් ඇසුරින් වෙන වෙනම පැහැදිලි කරන්න. (ල

*සොකරි*

**විවිධ අවස්ථා / ජවනිකා සන්නිවේදනය කිරීම**

- ස්ත්‍රියකට දරුවෙකු ලැබීම, එම දරුවා ප්‍රේක්ෂකයාට පිළිගැන්වීම හා දරුවාට සෙත් පැතීම යන අවස්ථා සන්නිවේදනය කිරීම
- කවි ගායනා හිටිවන කවි සහ සංවාද භාවිතය
  - සිද්ධි හා චරිතවල ස්වභාවය හැඳින්වීම
  - පොතේ ගුරුන්නාන්සේ විසින් ගයන සෑම පේළියක්ම අත්වැල් ගායකයෝ ගයති.
  - මෙහිදී චරිත රංග භූමියට ආරාධනා කිරීමට ද කවි යොදා ගනි
- චරිත හා රංග අවස්ථා
  - සොකරි, ගුරුහාමි පරයා, වෙදරාළ, ~~කොස්තානා~~ සොත්තානා ආදි චරිත රඟ දැක්වීම මගින් සන්නිවේදනය කරනු ලබයි.
  - සියලු රංග අවස්ථා අනුකරණය මඟින් ප්‍රේක්ෂකයාට පෙන්වයි..

    *උදා-*

    *ගුරු හාමි ඇතුළු පිරිස ලංකාවට පැමිණීමට භාවිත කරන නැව සාදන අයුරු පෙන්වීම*
- රංග වස්ත්‍රාභරණ හා රංග භාණ්ඩ භාවිතය

    *උදා-*

    *ගුරුහාමි - උඩරට වෙස් නැට්ටුවෙකුගේ ඇඳුම ඇසුරින් නිර්මාණය කර ඇත.*

    *සොකරි - උඩරට සාම්ප්‍රදායික කාන්තාවගේ ඔසරිය හා ආභරණ*

    *රංගභාණ්ඩ - උඩරට ගැටබෙරය, උඩැක්කිය, දවුල, තාලම්පට*

**කෝලම්**

- සමාජයේ විවිධ සිද්ධි හා චරිත පිළිබඳව සන්නිවේදන අවස්ථා ජනනය කිරීම

    *උදා - පොලිස් කෝලම*

    *ආරච්චි කෝලම*

    *මුදලි කෝලම*

    *නොංචි කෝලම*

    *ජස කෝලම*

  ස්ත්‍රී චරිත පුරුෂයන් විසින් රඟ දක්වනු ඇත.
- විනෝදාස්වාදය ප්‍රධාන අරමුණක් ලෙස සන්නිවේදනය කරනු ලබයි.
- *වෙස් මුහුණු /වස්ත්‍ර භාවිතය*

  චරිතයට සුදුසු වර්ණවත් වෙස් මුහුණක් හා නියමිත වස්ත්‍රයක් මගින් සන්නිවේදන අවස්ථා මතු කිරීම
- *කවි, දෙබස් සංවාද භාවිතය*

  උස් හඬින් ගායනා කිරීම, චරිතය සභාවට පිවිසීමට පෙර කවියෙන් හඳුන්වා දීම. අත්වැල් ගායනා.
- චරිත එකට ගළපමින් කතාවක් ඉදිරිපත් කිරීම
- රංග භූමිය - ගොරකා අතු, ගොක් කොළ, ලි කණු ආදිය භාවිත කර රංග භූමිය සකසා ඇත. ස්වභාවික ද්‍රව්‍ය භාවිත කර ඇත.

***මීට අමතරව වෙනත් ගැමි නාටක ලියා ඇති විට සාකච්ඡා කර ලකුණු ලබා දෙන්න. (රූකඩ, දෙබස් කථන, මුද්‍රා නාට්‍ය, (ජහුටා), කාමන්කූත්තු, නාඩ්ටුක්කූත්තු)***

***ලකුණු 8 x 2 =16***



CamScanner

5. (i) ගුවන්විදුලි මාධ්‍යයේ ලක්ෂණ දෙකක් නම් කරන්න.

- ශ්‍රව්‍ය මාධ්‍යයක් වීම.
- ක්ෂණික බව
- එක් දිශාවකට සංදේශ ගමන් කිරීම
- ජංගමශීලී මාධ්‍යක් වීම
- පහසුවෙන් පරිහරණය කළ හැකි වීම
- පරිකල්පනීය මාධ්‍යයක් වීම
- අඩු වියදම් සහිත මාධ්‍යයක් වීම
- එක් වරකදී තේරුම් ගත හැකි ලෙස සංදේශ ඉදිරිපත් කළ යුතුවීම
- භූගෝලීය බාධක අවම වීම
- විශාල භූගෝලීය සීමාවක් ආවරණය වීම
- සාක්ෂරතාව අවශ්‍ය නොවීම
- සමීප මාධ්‍යයක් වීම

ලකුණු 2 x2=4

(ii) කථන සන්නිවේදන කුසලතා වර්ධනයට ඉවහල් වන කරුණු දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

- සවන්දීම
- කියවීම
- දක්ෂ කථිකයන්ගේ කතා අනුකරණය කිරීම
- කථන පුහුණුව
- තනි පුද්ගලයකු ට ඇමතීම
- සමූහයක් ඇමතීම
- නිවැරදි උච්චාරණය
- අභිමුව සිටින පිරිසට ඇසෙන පරිදි කතා කිරීම
- විවිධ දේ කථනයෙන් ඉදිරිපත් කිරීම
- වාග් කෝෂය පුලුල් කර ගැනීම
- යෝග්‍ය භාෂා ශෛලියක් අනුගමනය කිරීම
- යෝග්‍ය පරිදි නිර්වාචික සන්නිවේදන විධික්‍රම භාවිත කළ හැකි වීම
- අදාළ සන්දර්භයට ගැලපෙන ලෙස කථනයේ යෙදීම
- ඉලක්ක ග්‍රාහක පිරිසට අනුව කථනය සිදු කිරීම

ලකුණු 4 x 2= 8

(iii) වර්තමානයේ සාක්ෂරතා සංකල්පය විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පුළුල් වී ඇත. පහතින් දැක්වෙන ක්ෂේත්‍ර දෙක පිළිබඳ නිදසුන් සහිතව පැහැදිලි කරන්න.
(අ) දෘශ්‍ය සාක්ෂරතාව (visual literacy)
(ආ) පරිගණක සාක්ෂරතාව (computer literacy)

(අ) දෘශ්‍ය සාක්ෂරතාව - රූපමය අර්ථ නිරූපණය, රූපමය නිර්මාණාත්මක සංයුතිය අවබෝධ කර ගැනීම, රූප නිර්මාණය කිරීමේ හැකියාව.වර්ණ, හැඩතල ,ආලෝකය ආදිය තේරුම් ගැනීම හා විධිමත් ලෙස භාවිත කිරීම.යෝග්‍යතාව මත සංඥා / සංකේත තෝරාගෙන භාවිත කිරීම

(ආ) පරිගණක සාක්ෂරතාව - පරිගණක තාක්ෂණය හඳුනා ගැනීම, භාවිත කිරීම හා නිර්මාණය කිරීම, අවශ්‍ය අවස්ථාවලදී ගැළපෙන තාක්ෂණික මෙවලම් හා මෘදුකාංග තෝරාගෙන භාවිත කිරීමේ හැකියාව.

*පැහැදිලි කිරීමට 4x2=8*
*නිදසුන් දැක්වීම 2x 2=4*
*මුළු ලකුණු = 12*

(iv) ගෝලීය සංස්කෘතිය වර්තමාන සමාජ වෙනස්වීම්වලට බලපා ඇති ආකාරය ප්‍රධාන කරුණු හතරක් ඇසුරින් පැහැදිලි කරන්න.

- ජාතික සංස්කෘතික සාධක යටපත් කිරීම හා ඉස්මතු කිරීම
- ගෝලීය ජනප්‍රිය සංස්කෘතිය ව්‍යාප්ත කිරීම .
- පාරිභෝගික සංස්කෘතියක් ඇති කිරීම
- බහු භාණ්ඩකරණයට ලක්වීම.
- සංස්කෘතික කම්පනයක් ඇතිවීම.
- මානව සම්බන්ධතා යාන්ත්‍රිකරණය වීම
- මාධ්‍ය ආයතන ප්‍රමාණාත්මකව වැඩිවීම
- වාණිජකරණයට ලක්වීම
- විනෝදාස්වාද සම්පාදනය ප්‍රබල වීම
- පුද්ගලයා හුදකලා වීම
- මාර්ගගත අධ්‍යාපන ක්‍රම වලට යොමුවීම
- බටහිර සංස්කෘතික සාධක ස්මතු කිරීම

*ලකුණු 4 x 4 = 16*



CamScanner

6. (i) සිනමා මාධ්‍යයේ ප්‍රධාන ප්‍රවර්ග දෙකක් නම් කරන්න.

- ක්‍රියාකාරී (Action)
- වික්‍රමාන්විත (Adventure)
- ග්‍රාෆික / සජීවිකෘත (Animated)
- චරිතාපදාන (Biopic)
- කාටූන් (Cartoon)
- හාස්‍යෝත්පාදක (Comody)
- වාර්තා (Documentary)
- සන්ත්‍රාස (Horror)
- ප්‍රේම (Romance)
- සංගීත (Music)
- විද්‍යා ප්‍රබන්ධ (Science Fiction)
- ත්‍රාසජනක (Thtiller)
- යුද්ධ (War)

*ලකුණු 2 x 2= 04*

(ii) ජන සන්නිවේදන ක්‍රියාවලියේ දී පණිවිඩයට සිදුවිය හැකි හානිය, ප්‍රධාන බාධක වර්ග දෙකට අදාළව විස්තර කරන්න. (ල

(ii)

- *අර්ථ බාධක*

  සංදේශයේ අර්ථය හරිහැටි අවබෝධ කර ගැනීමට නොහැකි වීම නිසා සිදුවන බාධාවන්ය.

  විරාම ලකුණු ,පද බෙදීම ආදිය අපැහැදිලි වීම, විදග්ධ භාෂාවක් යොදා ගැනීම. සංදේශය ඉදිරිපත් කරන භාෂාව අපැහැදිලි වීම, උච්චාරණ දෝෂ, උපභාෂා හා ප්‍රාදේශීය භාෂා භාවිතය, තාක්ෂණික හෝ පාරිභාෂික වචන වැඩි වශයෙන් යොදා ගැනීම

- *මාධ්‍ය බාධක*

  සන්නිවේදන නාලිකාවේ පවතින දෝෂ සහගත තත්ත්වයන් නිසා ඇතිවන බාධාවන්ය

  තීන්ත බොඳවීම, ඡායාරූප අපැහැදිලි වීම, සංඛ්‍යාත පද්ධතියේ දුර්වලතා, ප්‍රතිවාදනය වීම, රූප රාමුව පැහැදිලි වීම, රූපවාහිනී තරංග දුර්වල වීම, එක මත එක මුද්‍රණය වීම, ප්‍රතිවාදනය වීම ,සංඥා දුර්වල වීම, ශාරීරික, මානසික දුබලතා, තාක්ෂණික බාධක

*ලකුණු 4 x 2 =8*



CamScanner

(iii) මාධ්‍ය විචාරය කිරීමේ දී යොදාගත හැකි දෘෂ්ටිවාද තුනක් පැහැදිලි කරන්න.

*මාක්ස්වාදී විචාරය*

- ධනේශ්වර සමාජයේ අවශ්‍යතා වරප්‍රසාද හා බලය වෙනුවෙන් මාධ්‍ය නිෂ්පාදන ගොඩනැගෙන බව විග්‍රහ කරයි

*මනෝ විශ්ලේෂණ විචාරය*

- මනෝවිද්‍යාත්මක පදනමක පිහිටා මාධ්‍ය සන්දේශ විචාරයට ලක් කරයි.
- මාධ්‍ය සංදේශ සැඟවුණු මනෝභාවයන්ට අමතන ආකාරය පිළිබඳ අවධානය යොමු කරයි
- මාධ්‍ය භාවිතයෙහි යටි අරුත විමසයි
- සිතිවිලි හා හැඟීම් මගින් ආතතිය ඇති කරනනේ කෙසේ ද යන්න විමසයි.

*ස්ත්‍රීවාදී විචාරය*

- ස්ත්‍රී අයිතිවාසිකම්, ලිංගිකත්වය යන සාධක මත මාධ්‍ය සංදේශ විචාරය කරයි.
- සංදේශය තුළ කාන්තාව අවප්‍රමාණ වීම හා ඊට බලපාන හේතූන් විමසයි
- කාන්තාව වෙළඳ භාණ්ඩයක් (Comodity) ලෙස නිරූපණය කෙරේ.

*ලකුණු 4 x 3 =12*

(iv) "සමාජ මාධ්‍යයන්ගේ සමාජ බලපෑම ධනාත්මක මෙන්ම ඍණාත්මක විය හැකි ය." ධනාත්මක හා ඍණාත්මක බලපෑම් දෙක බැගින් වෙන වෙනම නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

*ධනාත්මක බලපෑම්*

- සක්‍රිය ග්‍රාහකයෙකු නිර්මාණය වීම
- පුද්ගල නිර්මාණශීලිත්වය බෙදා හදා ගත හැකි වීම
- පවතින තත්ත්වයන් අවබෝධ කරගත හැකි වීම
- වඩා පහසුවෙන් හා සෘජු ලෙස විරෝධාකල්ප ප්‍රචලිත කිරීමට හැකි වීම
- අධ්‍යාපන කටයුතු වලට ප්‍රයෝජනවත් වීම
- කාර්යක්ෂමව හා අඩු වියදමකින් තොරතුරු හුවමාරු කර ගත හැකි වීම
- ව්‍යාපාරික කටයුතු හා වෙළඳ සන්නාම ප්‍රවර්ධනයට හැකි වීම
- දුරස්ථ ඉගෙනුම් ක්‍රියාවලියට යොදා ගත හැකි වීම
- විකල්ප ධාරාවේ ප්‍රකාශන මාධ්‍යයක් වීම
- ක්ෂණික ප්‍රතිචාර දැක්වීමට හැකි වීම
- සමාජ සම්බන්ධතා වර්ධනය වීමට හේතු වී තිබේ.

*ඍණාත්මක බලපෑම*

- මානසික හා සමාජීය කම්පනය ඇති කිරීම
- ප්‍රචණ්ඩ ක්‍රියාවලට පෙළඹවීම
- පෞද්ගලිකත්වය පිළිබඳ ගැටලු ඇති වීම
- සයිබර් හිරි හැර /අපරාධ සිදු වීම
- ව්‍යාජ තොරතුරු සංසරණය වීම
- ව්‍යාජ ගිණුම් පවත්වා ගෙන යාම
- පුද්ගල අපහාස බහුල වීම
- අසභ්‍ය වැඩසටහන්වලට නැඹුරු වීම

උදාහරණ 1x4=4

ධනාත්මක බලපෑම ලකුණු 3x2=6
ඍණාත්මක බලපෑම ලකුණු 3x 2=6
මුළු ලකුණු = 16

7. ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතියක් සකස් කරමින් සිටි විශේෂඥයෙකුට රාජ්‍ය ආයතන කිහිපයක් පිළිබඳ තොරතුරු අවශ්‍ය විය.

(i) තොරතුරු අයිතිය පනත යටතේ ආයතනවලින් ලබාගත නොහැකි තොරතුරු වර්ග (ව්‍යතිරේක) දෙකක් නම් කරන්න.

- පෞද්ගලිකත්වයට හානි විය හැකි තොරතුරු
- රාජ්‍ය ආරක්ෂාවට අගතිදායක තොරතුරු
- ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික සබඳතා හා අදාල ගිවිසුම් වලට අගතිදායක වන තොරතුරු
- පෞද්ගලික වෛද්‍ය / වාර්තා
- නීතිපති දෙපාර්තමේන්තුව මගින් ප්‍රසිද්ධ කිරීමට අනුමත නොකරන ලද ලේඛන
- විභාගවලට අදාළ රහසිගත තොරතුරු
- බුද්ධිමය දේපළ පනත යටතේ ආරක්ෂාව හිමිවන වාණිජ රහස්

ලකුණු 2 x 2 =4

(ii) මහජනයාගෙන් තොරතුරු ලබාගැනීමට ප්‍රශ්නාවලියක් සකස් කර තිබුණි. ප්‍රශ්නාවලියක් සකස් කිරීමේ දී නොකළ යුතු කරුණු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

- පක්ෂපාත පිළිතුරු අපේක්ෂාවෙන් ප්‍රශ්න ඇසීම
- අනුමාන ප්‍රශ්න ඇසීම
- ව්‍යාකූල ප්‍රශ්න ඇසීම
- දත්තදායකයන් අපහසුතාවයට පත්වන ආකාරයේ ප්‍රශ්න ඇසීම
- එකම ප්‍රශ්නය නැවත ඇසීම
- ප්‍රශ්නාවලියේ ගලා යාම පිළිබඳ සැලකිලිමත් නොවීම
- ප්‍රශ්න ස්ථානගත කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු නොකිරීම
- දීර්ඝ ප්‍රශ්න ඇසීම

ලකුණු 4 x 2 =8

(iii) සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ දී ගැටුම් මතු විය හැකි ය. ගැටුම් නිරාකරණයේ දී ගනු ලබන පියවර තුනක් විස්තර කරන්න.

- ගැටුම තේරුම් ගැනීම
- ප්‍රතිපක්ෂය සමඟ සාකච්ඡා කිරීම
- ප්‍රයෝගික යෝජනා ඉදිරිපත් කිරීම
- හොඳම විසඳුම තෝරාගැනීම
- තෙවන පාර්ශවයේ මැදිහත්කරුවකු භාවිත කිරීම
- විකල්ප සොයා ගැනීම
- පාර්ශව දෙකටම පිළිගත හැකි (Win – Win) විසඳුමකට එළඹීම සඳහා උත්සාහ ගැනීම

ලකුණු 4 x 3 =12



Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more! CamScanner

(iv) සංවර්ධනය පිළිබඳ තොරතුරු සමාජගත කිරීමේ ක්‍රියාවලියේ දී මාධ්‍ය අභිසරණය බලපෑනු ලැබේ. පහත මාධ්‍ය ඇසුරින් මාධ්‍ය අභිසරණය පැහැදිලි කරන්න.
(අ) පුවත්පත
(ආ) ගුවන්විදුලිය
(ඉ) රූපවාහිනිය
(ඊ) සිනමාව

*පුවත්පත - අන්තර්ජාල සංස්කරණ (Internet Version) භාවිතයේදී,*

- ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීම
- ක්ෂණිකව තොරතුරු කියවීම
- හුවමාරු කර ගැනීම
- පුවත්පත් සිරස්තලයට අදාළ කරුණු වීඩියෝ, ඡායාරූප, හඬ පට ආදිය භාවිත කිරීම
- පසුගිය පුවත්පත් පරිශීලනය
- අවශ්‍ය තොරතුරු බාගත කිරීම
- තොරතුරුවල ස්වභාවය අනුව වර්ග කිරීම
- ග්‍රාහක රුචිකත්වය අනුව තොරතුරු ලබා ගැනීම

*ගුවන්විදුලිය - අන්තර්ජාල සංස්කරණය (Internet Version) භාවිතයේදී,*

- දේශීය විදේශීය නාලිකා ශ්‍රවණය කිරීමට හැකිවීම
- විශේෂීකරණ නාලිකා පරිහරණය (ක්‍රීඩා/ සංගීත)
- ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීම - හුවමාරු කර ගැනීම
- බාගත කිරීම
- ජාත්‍යන්තර, ජාතික, ප්‍රාදේශීය, ප්‍රජා ගුවන්විදුලි සේවා සමඟ සම්බන්ධ විය හැකි වීම
- විශුවල් රේඩියෝ, වෙබ් රේඩියෝ

*රූපවාහිනිය - අන්තර්ජාල සංස්කරණය (Internet Version) භාවිතයේදී,*

- දේශීය/ විදේශීය නාලිකා නැරඹීම
- විශේෂීකරණ නාලිකා පරිහරණය
- ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමේ හැකියාව
- අන්තර්ගතය හුවමාරු කර ගැනීම
- බාගත කිරීම
- රූපවාහිනී ,ටෙලි නාට්‍ය, කාටූන් ,ටෙලි චිත්‍රපට යනාදිය යූටියුබ් මගින් නැරඹීම

*සිනමාව - අන්තර්ජාල සංස්කරණය (Internet Version) භාවිතයේදී,*

- දේශීය විදේශීය චිත්‍රපටි නැරඹීම
- විවිධ භාෂා හා සංස්කෘතීන්වලට අයත් චිත්‍රපටි නැරඹීම
- විවිධ ප්‍රවර්ග වලට අයත් චිත්‍රපටි නැරඹීම
- පුද්ගල රුචිකත්වයට අනුව චිත්‍රපටි නැරඹීම
- චිත්‍රපට බාගත කිරීමේ හැකියාව
- නිර්මාණය කර උඩුගත කිරීම
- ඇනවුම්කර චිත්‍රපට නැරඹීම ( OTT)

ඒ ඒ මාධ්‍යයට අදාළව ඉහත කරුණු හෝ අදාළ වෙනත් කරුණු සහිතව අභිසාරිතාව පැහැදිලි කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න.

*ලකුණු 4 x 4 =16*

PAST PAPERS WIKI



(17) www.PastPapers.WiKi (17)
CamScanner


PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න